// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2369/39 – 2024 පෙබරවාරි මස 02 වැනි සිකුරාදා – 2024.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/1981 (II)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

24ඇ වන වගන්තිය සහ 24ඈ වන වගන්තිය යටතේ වූ නියමය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24ඇ වන වගන්තිය සහ 24ඈ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පරිසර අමාත්‍ය, කෙහෙළිය රඹුක්වැල්ල වන මා විසින්, මේ නියමය මගින් -

(අ) මෙහි I වන උපලේඛනයේ I වන, II වන, සහ III වන කොටස්වල දක්වා ඇති ඉම් සලකුණු හා සීමා තුළ පිහිටි භූමි ප්‍රදේශය, පනතේ කාර්ය සඳහා පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් විය යුතු බවටත් (මෙහි මින්මතු "ආරක්ෂක ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) එම භූමි ප්‍රදේශය "ඒතාලෙයිකුලම් වැව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවත් ;

(ආ) මේ නියමය බලාත්මකව පවතින තාක්කල් -

(i) ඉහත කී පනතේ විධිවිධාන සමග ගැටෙන්නා වූ ආරක්ෂක ප්‍රදේශය තුළ වූ යම් සැලසුම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක්, මේ නියමය ක්‍රියාත්මක වන දිනයේ සිට ක්‍රියාත්මක වීම නතර විය යුතු බවත් ;

(ii) අධිකාරිය නොවන කිසිම තැනැත්තකු විසින්, ආරක්ෂක ප්‍රදේශය ඇතුළත යම් සැලසුම් සම්පාදනයට සහ සංවර්ධනයට අදාළ බලතල, කාර්ය හා කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම නොකළ යුතු බවත් ;

එසේ වුව ද, අධිකාරිය විසින් ආරක්ෂක ප්‍රදේශය ඇතුළත සැලසුම් සම්පාදනයට සහ සංවර්ධනයට අදාළ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍යවලින් කිසිවක්, 26 වන වගන්තියේ විධිවිධාන යටතේ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, පළාත් පාලන ආයතනයකට හෝ යම් රජයේ නිලධරයකුට පවරනු ලබන අවස්ථාවක, එම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව, සංස්ථාව, ව්‍යාවස්ථාපිත මණ්ඩලය, පළාත් පාලන ආයතනය හෝ රජයේ නිලධරයා විසින් ඉහත කී වගන්තියේ විධිවිධානවලට යටත්ව එම බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම කළ හැකි බවත් ; සහ

(iii) ආරක්ෂක ප්‍රදේශය ඇතුළත වූ භෞතික සැලසුම් සම්පාදනය සහ සංවර්ධනයට අදාළ, අධිකාරියේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය, මෙහි II වන උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති කටයුතුවලට සීමාවිය යුතු අතර එම බලතල, කාර්ය හෝ කර්තව්‍ය, මෙහි II වන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම කළ යුතු බවත්,

ප්‍රකාශයට පත් කරමි.

මේ නියමයේ -

"පනත" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අදහස් වේ ; සහ

"අධිකාරිය" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ.

**ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල,**
පරිසර අමාත්‍ය.

2024 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ දී ය.

**I වන උපලේඛනය**

***I* වන කොටස**

1. ආරක්ෂක ප්‍රදේශයේ භූමි ප්‍රමාණය හෙක්ටයාර 36.4217ක් වේ.

2. එම ආරක්ෂක ප්‍රදේශය නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මාන්මුනායි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුකල්මඩම් උතුර ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටා ඇත.

3. ආරක්ෂක ප්‍රදේශයේ ඉම් සලකුණු හා සීමා පහත දැක්වෙන පරිදි වේ.

*උතුර* - කරත්ත පාර දිගේ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (GPS) සඳහන් ඛණ්ඩාංක නැ. 584640, උ. 839784 දරන ස්ථානයේ සිට ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ ( GPS) සඳහන් ඛණ්ඩාංක නැ. 584809, උ. 839849 දරන ස්ථානය දක්වා ;

*නැගෙනහිර* - අවසන් වරට සඳහන් කළ ස්ථානයේ සිට ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (GPS) සඳහන් ඛණ්ඩාංක නැ. 584865, උ. 839786, නැ. 584896, උ. 839722, නැ. 584930, උ. 839663, නැ. 584960, උ. 839629, නැ. 585034, උ. 839560, නැ. 585120, උ. 839373, නැ. 585169, උ. 839301, නැ. 585260, උ. 839220 දරන ස්ථාන දිගේ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (GPS) සඳහන් ඛණ්ඩාංක නැ. 585436, උ. 838951 දරන ස්ථානය දක්වා.

*දකුණ* - අවසන්වරට සඳහන් කළ ස්ථානයේ සිට පාරු පාර දිගේ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (GPS) සඳහන් ඛණ්ඩාංක නැ. 585125, උ. 838855 දරන ස්ථානය දක්වා.

*බටහිර* - කරත්ත පාර.


## *II වන කොටස*

**ආරක්ෂක ප්‍රදේශයේ ඉම් සලකුණු සහ සීමා පිළිබඳ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (GPS) සඳහන් ඛණ්ඩාංක**

| *අංකය* | *නැගෙනහිර ඛණ්ඩාංක* | *උතුරු ඛණ්ඩාංක* |
|---|---|---|
| 1 | 585436 | 838951 |
| 2 | 585260 | 839220 |
| 3 | 585169 | 839301 |
| 4 | 585120 | 839373 |
| 5 | 585034 | 839560 |
| 6 | 584960 | 839629 |
| 7 | 584930 | 839663 |
| 8 | 584896 | 839722 |
| 9 | 584865 | 839786 |
| 10 | 584809 | 839849 |
| 11 | 584640 | 839784 |
| 12 | 584740 | 839577 |
| 13 | 584844 | 839295 |
| 14 | 584947 | 839057 |
| 15 | 585125 | 838855 |

### *III වන කොටස*

### ආරක්ෂක ප්‍රදේශයේ සිතියම



## II වන උපලේඛනය

### *I වන කොටස*
### ආරක්ෂක ප්‍රදේශය ඇතුළත අවසරලත් කටයුතු

ආරක්ෂක ප්‍රදේශය ඇතුළත වූ භෞතික සැලසුම් සම්පාදනය සහ සංවර්ධනය පහත දැක්වෙන කටයුතු සඳහා පමණක් විය යුතුය :-

1. දැනට පවතින වාරි යෝජනා ක්‍රම කළමනාකරණය හා නඩත්තු කටයුතු.
2. ආක්‍රමණශීලී ආගන්තුක සත්ත්ව හා ශාක විශේෂ කළමනාකරණය.
3. මසුන් ඇල්ලීමේ කටයුතු.
4. ජලජ ශාකවලින් පුෂ්ප නෙලීම.
5. අධ්‍යාපනික හා පර්යේෂණ කටයුතු.
6. පාරිසරික සංචාරක කටයුතු (ස්ථිර හෝ තාවකාලික ඉදිකිරීම් නොමැති).

### *II වන කොටස*
### මේ උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති කටයුතු ආරක්ෂක ප්‍රදේශය තුළ සිදු කිරීමේදී අදාළ කර ගත යුතු කොන්දේසි

1. මේ උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති යම් භෞතික සැලසුම් සම්පාදනය සහ සංවර්ධනය පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව සිදු කළ යුතු ය:-

   (අ) ආරක්ෂක ප්‍රදේශය ඇතුළත සිදු කරන මසුන් ඇල්ලීමේ කටයුතු සඳහා යාන්ත්‍රික බෝට්ටු භාවිත නොකළ යුතු ය;
   (ආ) එම කටයුතු, ගම් වැසියන්ගේ සාමාන්‍ය ජීවන රටාවට හා ඔවුන්ගේ ජීවිකාවට සහ සත්ත්ව හා වෘක්ෂලතා වාසස්ථානවලට බාධාවක් ඇති නොවන පරිදි සිදු කළ යුතු ය;
   (ඇ) ආක්‍රමණශීලී ආගන්තුක සත්ත්ව හා ශාක විශේෂ ආරක්ෂක ප්‍රදේශයට හඳුන්වා නොදිය යුතු ය;
   (ඈ) කුමන හෝ තත්ත්වයක පවතින යම් අපද්‍රව්‍ය හෝ අපජලය ආරක්ෂක ප්‍රදේශයට බැහැර නොකළ යුතු ය;
   (ඉ) ඉඩම් ගොඩ කිරීම, භූමි හායනයට සහ පාංශු ඛාදනයට අදාළ කටයුතු ආරක්ෂක ප්‍රදේශයේ සිදු නොකළ යුතු ය;

2. අධිකාරිය විසින්, පනතේ 10 වන වගන්තියේ (ඒ) වන ඡේදයට යටත්ව, ආරක්ෂක ප්‍රදේශය ඇතුළත වූ සැලසුම් සම්පාදනය සහ සංවර්ධනයට අදාළ එහි කර්තව්‍ය සිදු කිරීමේ දී අධිකාරියට සහාය වීම පිණිස කමිටුවක් පත් කරනු ලැබිය හැකි ය.

3. එම කමිටුව -
   (අ) කමිටුවේ සම සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලැබිය යුතු අධිකාරියේ නැගෙනහිර පළාතේ අධ්‍යක්ෂවරයා සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්වරයා;

   (ආ) මාන්මුනායි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්වරයා;

   (ඇ) මාන්මුනායි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා;

   (ඈ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයකුගේ තනතුරට අඩු නොවන තනතුරක් දරන නිලධරයකු;

   (ඉ) අදාළ ගොවි සංවිධානයේ සභාපතිවරයා හෝ එම ගොවි සංවිධානයේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන අනුයෝජිතයකු; සහ

   (ඊ) අධිකාරිය විසින් අවශ්‍ය යයි නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් රජයේ ආයතනයක සහකාර අධ්‍යක්ෂවරයාගේ තනතුරට අඩු නොවන තනතුරක් දරන එවැනි නිලධරයන්,

යන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

EOG 02-0038

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.